**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පරිවාස ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ උපදේශන නිලධාරී III වැනි ශ්‍රේණියේ තනතුරට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම (විවෘත) - 2017**

1.0 2017.07.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද සබරගමුව පළාතේ පරිවාස ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය ( උපදේශන නිලධාරී තනතුර ) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන අනුව **උපදේශන නිලධාරී III වැනි ශ්‍රේණියේ තනතුරට** බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (විවෘත) සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන අතර, එය පැවැත්වෙන දිනය යථා කාලයේදී දන්වනු ඇත. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධානයන් පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය මත දිස්ත්‍රික් දෙකෙහි ඉහළම කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ උපදේශන නිලධාරී III වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

3.0 මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (විවෘත) මගින් සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව 02 කි. ඉදිරියේදී ඇතිවන පුරප්පාඩුද මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සම්පූර්ණ කරනු ලබන අතර, පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

4.0 වැටුප : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව **උපදේශන නිලධාරී III වැනි ශ්‍රේණිය**ට අදාළ වැටුප් කාණ්ඩය MN 4 - 2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 31,490- 10×445- 11×660- 10×730- 5×750 රු.54,250/- වේ. එහි II වන උපලේඛනය අනුව වැටුප් ගෙවනු ලැබේ.

5.0 **සුදුසුකම් :- සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ උපදේශන නිලධාරී III වැනි ශ්‍රේණියේ** තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | පළපුරුද්ද |
|---|---|---|
| උපදේශන නිලධාරී III ශ්‍රේණිය | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මනෝ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක්<br><br>සමඟ<br><br>I.උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්<br><br>හෝ<br><br>II.රජයේ ලියාපදිංචි ආයතනයකින් මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමාවක් ලබා තිබීම. | රාජ්‍ය හෝ රාජ්‍ය නොවන පිළිගත් ආයතනයක උපදේශන ක්ෂේත්‍රයට අදාළව වසරකට නොඅඩු සේවා පළපුරුද්ද |

(ඇ) කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම සබරගමුව පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඈ) වෙනත් සුදුසුකම් :

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

(ii) අයදුම්පත් කැඳවනු ලබන දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03ක් තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(iii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

සටහන : සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියළු සුදුසුකම් 2017.10.31 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**6.0 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය :**

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය (අවම සීමාව) |
|---|---|---|---|
| **01. <u>අතිරේක අධ්‍යාපන සුදුසුකම්</u>** | | | |
| I. මනෝ විද්‍යාව විෂයට අදාළ පශ්චාත් උපාධියක් ලබා තිබීම | 20 | 45 | 40% |
| II. සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමාව | 15 | | |
| III. සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව | 10 | | |
| **02. <u>පලපුරුද්ද</u>** | | | |
| උපදේශන නිලධාරියෙකු ලෙස සේවය කර ඇති කාල සීමාව (වසරකට ලකුණු 05 බැගින්) | 25 | 25 | |
| **03. <u>කුසලතා හා අනෙකුත් සුදුසුකම්</u>** | | | |
| I. උපදේශන සේවාව සම්බන්ධයෙන් කර ඇති පර්යේෂණ ග්‍රන්ථ හා ප්‍රකාශන | 05 | 20 | |
| II. සම්පත්දායකයෙකු ලෙස දක්වන ලද සක්‍රිය දායකත්වය | 05 | | |
| III. අධීක්ෂණ භාරයේ පසුවන්නන් සඳහා කර ඇති විශේෂ සේවාවන් (ප්‍රතිකාරාත්මක වැඩසටහන්, වැඩමුළු, කඳවුරු) | 05 | | |
| IV. සිදු කර ඇති විශේෂ ව්‍යාපෘති | 05 | | |
| **04. <u>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවයන්</u>** | 10 | 10 | |
| **එකතුව** | 100 | 100 | |

**සටහන :-**

මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධානයන් පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය මත දිස්ත්‍රික් දෙකෙහි ඉහළම ලකුණු කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටු කර ගැනීමට අපේක්ෂිත කායික යෝග්‍යතාවය සහ සහතික පරීක්ෂා කර සුදුසුකම් සනාථ කර ගැනීම ද මෙහිදී සිදු කෙරේ.

**7.0 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ගාස්තු :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ගාස්තුව රු. 200/- කි. එම ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට ( පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. **එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැරවන ලෙසය.** ගෙවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතුවේ.

**8.0 අයදුම්පත්‍ර :**

ඒ 4 ( සාමාන්‍ය හාෆ්ෂීට් ) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(අ) අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද,
(ආ) අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුලත් වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව අයදුම්පත්‍රය පිරවිය යුතුය.
(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසිපරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

8.1 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.2 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු, වාර්ෂික වැටුප රු. 240,360/- ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.3 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2017.10.31 වන දිනට හෝ ඊට පෙර **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත, සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

8.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ උපදේශන නිලධාරී III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (විවෘත)** යන්න හා ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

## 8.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයැදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

9.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් , ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතීරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

2017.10.03 දින
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන්
සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නවනගරය, රත්නපුර.

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ආදර්ශ අයදුම් පත්‍රය

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ උපදේශන නිලධාරී III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (විවෘත) – 2017

## Structured Interview (open) for the Recruitment to the post of Counseling Officer - Grade III of Sabaragamuwa Provincial Public Service - 2017

---

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය)

1.0 1.1 මුල'කුරු අගට යොදා මුල'කුරු සමඟ නම ..............................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A.B.C

1.2 සම්පූර්ණ නම ..............................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම ..............................
( සිංහලෙන් / දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

1.5 දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය ..............................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................

2.2 ස්ථිර ලිපිනය ..............................
( සිංහලෙන් / දෙමළෙන්) ..............................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය ..............................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..............................
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :..............................
3.3 පදිංචිව සිටින කාලසීමාව : ..............................
3.4 ග්‍රාම නිලධාරී කොට්ඨාශය : ..............................

4.0 4.1 ස්ත්‍රී/ පුරුෂ භාවය ස්ත්‍රී - 1 / පුරුෂ - 0 [ ] ( කොටුව තුළ අදාළ අංකය ලියන්න)

4.1 උපන් දිනය: වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

4.2 2017.10.31 වන දිනට වයස: අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

5.0 අධ්‍යාපන සුදුසුකම්

I . ලබා ඇති උපාධිය සහ විෂයයන් :....................................................
..........................................................................
..........................................................................
එම සහතිකය වලංගු දිනය......................................................
උපාධිය ලබා ඇති විශ්ව විද්‍යාලයේ/ආයතනයේ නම...............................
..........................................................................
( ලබා ඇති උපාධි සහතිකයේ පිටපතක් අමුණන්න. )

II. ලබා ඇති ඩිප්ලෝමාව:.................................................................
කාල සීමාව:.......................................................
( ලබා ඇති ඩිප්ලෝමා සහතිකයේ පිටපතක් අමුණන්න. )

6.0 පළපුරුද්ද:.......................................................................................................................
.....................................................................................................................................

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
( අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

8.0 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ගාස්තු ගෙවූ කාර්යාලය
:..........................................................................................................

(ii) ලදුපතේ අංකය හා දිනය :..........................................................................

(iii) ගෙවූ මුදල :..........................................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

8.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.......................................		.......................................
දිනය		අයදුම්කරුගේ අත්සන

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන........................................................ මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු / ඇය මා ඉදිරිපිට දී ......................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

| | |
|---|---|
| ........................................ | .................................................. |
| දිනය | සහතික කරන නිලධාරියාගේ අත්සන |

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම:...........................................................................
තනතුර:...........................................
ලිපිනය:...........................................
( නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10.0 රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිළධාරියකු විසින් කළ යුතුය.

(අ) මෙම දෙපාර්තමේන්තුවේ ................................................................ දින සිට ...................................................................තනතුරේ සේවය කරන .......................................................................................................මහතා/මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට උපයාගත යුතු සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිඳු විනය දඩුවමකට භාජනය වී නොමැති බවත්, අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(ආ) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරණ තනතුරෙන් මුදා හැරිය හැකි / නොහැකි බවත් දන්වමි.

..........................................................
දෙපාර්තමේන්තු ආයතන ප්‍රධානියා හෝ බලය පවරනු ලබන නිළධාරියාගේ අත්සන

නම:..............................................
පදවිය:...........................................
දිනය.............................................
දෙපාර්තමේන්තුව/ආයතනය...................
( නිල මුද්‍රාව තබන්න.)